**8.00 a.m. - Procession of Witness**

**9.00 a.m. - Thanks giving Service**

**11.00 a.m. - 150th Anniversary celebration**

**i. Lighting the oil lamp**

**ii. Theme Song**

**iii. Launch of the 150th Anniversary Souvenir**

**iv. A Brief History of the Church**

**12.00 Noon - Commemoration of Rt. Rev Lakshman Wicramasinghe**

**12 .30 p.m. - Fellowship Lunch**

පෙ.ව. 8.00 – සාක්ෂි දැරීමේ පෙරහැර

පෙ.ව. 9.00 – ස්තුතිදීමේ පූජාව

පෙ.ව. 11.00 – උත්සව සභාවේ ආරම්භය

1. පොල්තෙල් පහන දැල්වීම

2. තේමා ගීතය

3. 150 වන සමරු කලාපය එළිදැක්වීම

4. දේවස්ථාන ඉතිහාසයෙන් බිඳක්

මධ්‍යහ්න 12.00 – අතිගරු ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරු අනුස්මරණය

මධ්‍යහ්න 12.30 – දිවා ආහාරය



# 150 වන සාංවත්සර සමරු කලාපය

# *150th Anniversary Souvenir*

*1872 - 2022*

පටුන


- මූලාසන රදගුරුතුමන්ගේ සුබ පැතුම්..... 02
- වන්දනීය අනුනායක හිමිපාණන්ගේ සුබ පැතුම්..... 04
- පළාතභාර පියතුමාගේ සංවත්සර පණිවිඩය......... 07
- ජයනාත් පණ්ඩිතරත්න පියතුමාගේ සුබ පැතුම්..... 11
- සේවය කල පියතුමන්ලා සහ දහම් සේවක සේවිකාවන් 15
- ගරු රෝහණ රාජපක්ෂ පියතුමාගේ සුබ පැතුම්..... 16
- ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමාගේ සුබ පැතුම්..... 18
- ගරු රසික අබේසිංහ පියතුමාගේ සුබ පැතුම්..... 19
- සම්මාන අනුනායක නිමල් වික්‍රමරත්න පියතුමාගේ සුබ පැතුම්..... 22
- මනහර කඩුගන්නාව හා ඒ ආශ්‍රිත ඓතිහාසික පසුබිම..... 24
- කඩුගන්නාව හා අවට සුන්දර ස්ථාන ..... 30


SRI LANKA

CHRIST CHURCH PUBLICATION

2022

## කුරුණෑගල දියෝකීසියේ මූලාසන රදගුරුතුමන්ගේ සුබ පැතුම්.....



කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානයේ මා ප්‍රියාදර පූජකතුමන් හා ගිහි සහෝදර සහෝදරියනි,

කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථාන සභාවට තම ගමන් මගේ විශේෂ සන්ධිස්ථානයකදී හදපිරි සුබ පැතුම් ඔබ හා බෙදා ගැනීමට ලැබීම මම භාග්‍යයක් සේ සලකමි.

වසර එකසිය පනහකදී දියෝකීසියට, සමාජයට හා රටට සිදු වුණු සේවය කිසි ලෙසකින් වත් සුළුපටු නොවන අතර ඒ සියළු ම සේවාවන් දේවස්ථාන හා රටේ ඉතිහාසය තුළ රන් අකුරෙන් ලියැවෙනු ඇත.

උඩරට රාජධානියේ බිඳවැටීමෙන් පසු මහනුවර දියත් කරන්නට යෙදුණු ප්‍රථම ඇන්ග්ලිකානු මිෂන් සේවාවන් කොළඹ සිට ප්‍රධාන මාර්ගය පාදක කරගත් අතර, ඒවා මේ වන විට මිෂන් සේවාවන් සිදු කරන ප්‍රධාන මූලස්ථානයන් බවට පත්ව තිබෙන බව අප දන්නා කරුණකි.

ඒ ආලෝකය තුළින් මිෂනාරිවරුන් වර්තමාන ක්‍රිස්තු දේවස්ථාන බිම තුළ ගොඩනැගුණු අයුරුත් ඒ භූමිය තුළ මිෂනාරී මූලස්ථානයක් ගොඩ නැගූ අයුරුත් ගැන පරිකල්පනය කිරීම අසීරු නොවේ. නගරයේ හදවත වන් ප්‍රදේශය තුළ පිහිටා ඇති මෙම දේවස්ථානය පසුගියා වූ කාලය තුළ රට තුළ සිදුවූ දේශපාලන, ආර්ථික, සමාජීය වෙනස්වීම් වලට මුහුණ දීමට ද සිදුවන්නට ඇත.

අපි එවක කොළඹ දියෝකීසියට, වර්තමානයේ කුරුණෑගල දියෝකීසියට අයත් උඩරට ප්‍රදේශයට ව්‍යාප්ත වන්නට සේවාවන් ඉටු කළ මිෂනාරී මධ්‍යස්ථානයක් වූ මෙම දේවස්ථානයේ සේවාවන් ඉටුකළ දේශීය, ඉන්දීය මෙන්ම බ්‍රිතාන්‍ය ජාතික පූජකතුමන්ලා ගැන බොහෝ කතාන්දර කියවා ඇත්තෙමු. එමෙන්ම මෙහි සේවය කළා වූ, විවිධ වූ සේවාවන් වලට පංගුකාරී වුණාවූ ගිහි සේවක සේවිකාවන් ගැනද ස්තූතිවන්ත සිතින් සිහිපත් කරමු.
පසුගියා වූ දීර්ඝකාලය තුළ මෙම දේවස්ථානය සඳහා නිරන්තර ශක්තියක්



### සංවත්සර තේමා ගීතය

තුතිදී වදිමු සමි බැතියෙන
වැජඹේ පතමු නිති මතු දින //

කිතු සමිඳු නාමෙන් නොයෙක් රට වල
දනන් වෙනුවෙන් දිවිය කැප කළ
නිකායේ බැප්තිස්ත නම් ලද
දනෝ පසු පිළිගැන්වූ ලක් සබ

කඩුගන්නාව පුර වැර මැද
බැබළී දිලෙන පහනක් වෙද
එ නමින් කිතුතුමන් නම් ලද
මැඳුරයි දෙවිඳු හට පුද කල

තුතිදී වදිමු ..... //

එකුන් සිය පනසක් වස
විකුම් පා හෙළ දස අත
උතුම් කිතු දෙවි නමදින
දනෝ වෙති මෙහි ගැවසෙන


හෙළ දමිළ නන් දන කැල
එක්ව බැඳී සමි පා මුල
මුල් වූ සංහිඳියාවට
තෝතැන්න වුණි සැම කල

තුතිදී වදිමු ..... //

පද රචනය හා තනුව : රම්‍යා වික්‍රමරත්න මිය
සංගීත අධ්‍යක්‍ෂණය : ගරු අනුරුද්ධ පියතුමා



ආශිත ග්‍රන්ථ
ඉලංගසිංහ අයි. එම්. ඩී. බී, කුරුණෑගල දියෝකීසියේ වංශ කථාව, ශ්‍රී ලංකාව:1990
https://divaina.lk/එන්න විඳගන්න-කඩුගන්නාව, 2022/10/07
https://www.dinamina.lk/2021/11/30//විශේෂාංග/135629/කඩුගන්නාව-මට-කවදත්,මනරම්ය , 2022/10/07
https://roar.media/sinhala/main/history/memoirs-of-the-stone-carved-kandy-road, 2022/10/07
https://www.lankadeepa.lk/rasawitha//කඩුගන්නාවේ-මහ-ගලක්-විද--සුදු-ජාතිකයන්-පාර-හැදූ-හැටි, 2022/10/07
















දුන් දෙව්පියාණන් ට මෙම සුවිශේෂී සන්ධිස්ථානයට පා තබන මොහොතේ ස්තූතිවන්ත වෙමින් ඉදිරියටත් ඔබේ දේවස්ථානය කඩුගන්නාව ජනතාව වෙත ආලෝකයක් වේවායි අපි අපේ යැදුම්වලින් සිහිපත් කරමු. අපගේ නිරන්තර යැදුම වන්නේ ආදරය හා රැකවරණය තුළින් ක්‍රිස්තු දේවස්ථානය සියළුම දෙනාට ආදර්ශයක් වේවා යන්න යි.

මේ අති සුවිශේෂී සන්ධිස්ථානය අප, ඔබ සමඟ සමරන මේ මොහොතේ අපගේ උණුසුම් සුබපැතුම් ඔබට පිරිනමන අතර අතීතය සිහිපත් කරමින් වර්තමානය මෙනෙහි කරමින් අප ස්වාමීවූ ජේසුස්වහන්සේ ගේ මාවත තුළින් සියළු දැඩි හා පහසු මාර්ග තුළ ගමන් කරමින් අනාගතය දෙස බැලීමට අපි මෙය අවස්ථාවක් කරගනිමු.

දෙවියන්වහන්සේ යහපත් ව සිටිමින්, සියළු ආශිර්වාද උන්වහන්සේ තුළින් ලැබ දෙන මෙන් අපි යැදුම්වලින් සිහිපත් කරන අතර ඒ තුළින් ඔබගේ සමූහය යන ඇදහිල්ලේ ගමන බොහෝ දෙනා වෙතට ආශිර්වාදයක් වනු ඇත.

අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරු හිමි
කුරුණෑගල දියෝකීසියේ  මූලාසන රදගුරු හිමි

දේවස්ථාන නත්තල් වැඩසටහන 2021



**වන්දනීය අනුනායක හිමිපාණන්ගේ සුබ පැතුම්.....**



ප්‍රිය සැදැහැවත් බැතිමතුනි,

කඩුගන්නාව අප ක්‍රිස්තු දේවස්ථාන කිතුනු සංඝය, තම අධ්‍යාත්මික ගමනේ වසර 150 ක් සම්පූර්ණ කිරීම දැකීම සැබවින්ම දෙවිඳුන්ට තුති පිදිය යුතු අවස්ථාවකි. සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයට වසර 70-80 හෝ ඊට මදක් වැඩියෙන් ජීවත්වීමේ භාග්‍ය හිමි වුවත්, දේවස්ථාන සමූහයකට වසර 150ක තම අධ්‍යාත්මික දිවිය සැමරීමට ලැබීම සැබෑවූ දේව වරප්‍රසාදයක් වේ. මේ පරම්පරා 2ක් හෝ 3ක අධ්‍යාත්මික වර්ධනය සමාජ ජීවිතයේ පරිනතභාවයට පත්වීම සැබෑ ලෙසම දිගු අත්දැකීමකි. මෙනයින් ගත් කල කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථාන පළාතට අයත් ඇදහිලිවත් ප්‍රජාව සැබෑම ආශිර්වාද ලත් ප්‍රජාවක් වේ.

යටත් විජිත (ඉංග්‍රිසි) යුගයේ බැප්ටිස් මිෂනාරිවරුන් විසින් අරඹන ලද මෙම සභාව ඇන්ග්ලිකානු (සී. එම්. එස්.) මිෂනාරි ආයතනයට බාර දීමෙන් අනතරුව, උක්ත මෙහෙවර වඩාත් සවිමත්ව ඉටුකිරීම සඳහා මිෂනාරිවරු, වත්මන් දේවස්ථාන පළාත තුලින් ක්‍රියා කල බව අපට පසක් කරගත හැකිවේ. කඩුගන්නාව ප්‍රදේශයේ වතු ආශ්‍රිත වැවිලිකරුවන්ට හා එහි නිළධාරින්ටත්, කඩුගන්නාව දුම්රිය පල ආශ්‍රිතව සේවය කල නිලධාරීන් සඳහා අධ්‍යාත්මික සේවා සැපයීම මෙමගින් මූලිකව සිදු වුණි. එමෙන්ම කොළඹ නුවර මහාමාර්ගය සහ කොළඹ නුවර දුම්රිය මාර්ග ගොඩනැගිමේදි ක්‍රියාකල බොහෝ රාජ්‍ය නිළධාරින්, තාක්ෂණ ශිල්පින්, ඉංජිනේරුවන් හා කම්කරුවන් සඳහා අධ්‍යාත්මික රැකවරණය හා මගපෙන්වීම ලබාදුන් කඩුගන්නාව දේවස්ථානය තදාසන්න පළාත්වල දේව මෙහෙවර හා සුභාරංචිය ප්‍රචාරයෙහිලා සිදුකොට ඇති බලපෑමද අමතක කල යුතු නොවේ..

වසර 1981 දක්වා අඛණ්ඩව දේවස්ථාන පළාතක් ලෙස පැවති මෙම සභාව, 1981 දි ගෞ. සෑම් ද සිල්වා දේවගැතිතුමාගෙන් වෙනත් මුහුණුවරක් ගත් අතර, ධර්මදූත මෙහෙවර වඩාත් නිදහස් හා නවාකාර ස්වරූපයක් ගත්තේය. එතුමන් ස්වර්ගස්ථ වන තුරු එහි බලපෑම මෙම



වන ලදි.

මෙම දේවස්ථානය තුල ගරු ඒ. ආර් ඩයස් අබේසිංහ පියතුමා, ගරු ටී. ජී. අබේසිංහ පියතුමා ගරු බ්‍රයන් තිරිමාන්න පියතුමා 1961-1965, ගරු පී. වී. කොයිල්පිල්ලෙයි පියතුමා, ගරු ජේ. වී. දේවදාස් පියතුමා, ගරු මෙසියා දාස් පියතුමා, ගරු ඩී. ජේ. කනගරත්නම් පියතුමා, නල්ලතම්බි පියතුමා, සිඩ්නි නයිට් පියතුමා, ගරු සෑම් ඩි සිල්වා පියතුමාත් සේවය කර ඇත.

දේවස්ථානයේ දමිළ සභිකයින් වෙනුවෙන් රත්නායගම් මහතා සහ දෙමළ පාසලේ ප්‍රධාන ආචාර්යය ජේ. ආර් සතියන්දාස් මහතා කුරුණෑගල දියෝකීසිය නියෝජනය කර ඇත.

එසුව 2006 සිට 2009 දක්වා ගරු ජයනාත් පණ්ඩිතරත්න පියතුමාද,2009 සිට 2013 දක්වා ගරු රෝහණ රාජපක්ෂ පියතුමා, 2012 සිට 2013 දක්වා ගරු රසික අබේසිංහ පියතුමා සහයක පියතුමා ලෙසද, 2014 සිට 2015 දක්වා ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමා, 2016 දී ගරු රසික අබේසිංහ පියතුමාද, 2017 දී ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමාද, 2018 සිට 2020 දක්වා වන්දනීය නිමල් වික්‍රමරත්න පියතුමාද, 2021 සිට 150 වන සංවත්සරය සමරණ මොහොත දක්වා ගරු අනුරුද්ධ බණ්ඩාර පියතුමාද සේවයේ යෙදෙයි.

සේවය කල දහම් සේවක සේවිකාවන් අතර මල්ලිකා එඩ්වඩ්ස් සහෝදරතුමිය, දුමින්ද ජයසිංහ සහෝදරතුමා, මල්ලිකා විජේරත්න සහෝදරතුමිය, මැටිල්ඩා විලියම්ස් සහෝදරතුමිය, කුමුදුනී අබේසිංහ සහෝදරතුමියද දේවස්ථානයේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කර ඇත.

යම් යම් වකවානුවල විවිධ දේවස්ථාන වලින් පැමිණි පියතුමන් හා පිළිමතලාව දේවධර්ම විද්‍යාලයේ ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ද ඉරු දින පූජාවන් හා ආගමික කටයුතු වෙනුවෙන් සහය ලබා දී ඇත.

දිගේ කොළඹ බලා ගමන් කිරීම ඇරඹුණි.

**ක්‍රිස්තු සභාව ගොඩනැංවීම හා ඉතිහාසයෙන් බිඳක්**

මෙම දේවස්ථානය මීට ප්‍රථම බැප්ටිස්ට් දේවස්ථානයක් ලෙස පැවති අතර මෙය බ්‍රවුන්රිග් මාවතේ වෙස්ලියානු කුඩා දෙවි මැදුර , නුවර වෝඩ් මාවතේ බැප්ටිස්ට් දෙවිමැදුර ආදී දෙවිමැදුරු වල සැලසුම් නිර්මාණය කළ බැප්ටිස්ට් දේවගැතිතුමෙකු වූ එෆ්. ඩී වොල්ඩ්කොක් දේවගැතිතුමාගේ සැලසුමකට අනුව නිර්මාණය කරන ලද්දකි. මෙම කිතුණු නමස්කාර ස්ථානය පසුව සී. එම්. එස්. මිෂනාරිවරුන් වෙත 1872 ඔක්තෝබර් 11 වනදා භාර කරන ලදුව පසුව ක්‍රිස්තු දේවස්ථානය ලෙස නම් තබන ලදි.

ආරම්භයේ සිටම රත්මීවෙල ක්‍රිස්තු රජිඳු දේවස්ථානයේ සිටි පූජකවරුන් විසින් මෙම දේවස්ථානයේ ධර්මදූත සේවාවන් සිදු කරන ලදි.

වාර්තාවන් වලට අනුව කුරුණෑගල දියෝකීසියේ මුල් රදගුරු අතිගරු ලක්දාස ද මෙල් හිමිපාණන් මෙහි පළාත භාර පියතුමා ලෙස 1945 හෝ ඒ ආසන්න කාලයක කටයුතු කර ඇත.

ඉංග්‍රීසි හා සිංහල භාෂාවන් වලින් චර්ච් මිෂනාරි වරුන් විසින් දේවමෙහෙයන් සිදුකරන ලද අතර, දෙමළ දේව මෙහෙයන් දෙමළ ක්‍රිස්තියානි මිෂනාරි සමාජය විසින් සිදුකරන ලදි.

වාර්තාවන් වලට අනුව 1947 වර්ෂයේදී ගීතිකා කණ්ඩායම වෙනුවෙන් වොලී බෝවර්ස් මහත්මිය දේවස්ථාන දේව මෙහෙයන් වල ඕගන් වාදනයෙන්ද බැලුම්ගල වතුයායේ වතු අධිකාරී විලී හර්මන් මහතා, දේවස්ථාන ලේකම් ලින් දිසානායක මහතා දේවස්ථාන කටයුතු සඳහා ඉමහත් දායකත්වයක් දක්වා ඇත. මෙය 1951 දී කුරුණෑගල දියෝකීසිය වෙතට පවරා ගෙන ඇති අතර 1956 - 1961 දක්වා දේවස්ථානය පිළිබඳ තොරතුරු වාර්තා නොවේ. කෙසේ වෙතත් ලින් දිසානායක මහතා දේවස්ථානය වෙනුවෙන් කුරුණෑගල දියෝකීසිය නියෝජනය කර ඇත

බ්‍රයන් තිරිමාන්න පියතුමාගේ කාලයේ 1961-1965 දේවස්ථානය යළි සක්‍රීය



පළාතට දැනුණු අතර, වසර ගණනාවක සේවය පිලිබඳව ස්තූතිය ගෞ. සෑම් සිල්වා පියතුමාගේ පවුලේ සාමාජිකයන් වෙත අපි පිලිගන්වමු.

වඩාත් අභියෝගාත්මක කාල පරිච්ජේදයකට එළඹි අප, කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථාන පළාත නව බැතිමතුන් සොයා ගිය ගමනක මං සලකුණු පෙන්වනු ඇත. කෙසේ වෙතත් ගෞ. ශාන්ත ප්‍රැන්සිස් පියතුමා, ගෞ. ජයනාත් පණ්ඩිතරත්න පියතුමා ඇතුලු වර්තමානයේ ගෞ. අනුරුද්ධ බණ්ඩාර පියතුමාගේ අභිප්‍රාය ධෛර්ය නිසා දේවස්ථාන ගොඩනැගිල්ලට නව ස්වරූපයක් හා දේවස්ථාන වහල (2021 වසරේ) නවීකරණය සිදුකල අතර, වත්මන වන විට දේවස්ථානයේ දෛනික නමස්කාරය හා එඬේර සේවය සාමාන්‍ය පරිදි සිදු කිරීමට අවස්ථාව ලැබී තිබීම සැබවින්ම දෙවිඳුන්ට කෘතඥ විය යුතු ආශිර්වාදයක් වේ.

සැබවින්ම කිතුනු අධ්‍යාත්මික පවුලක ස්වභාවය ක්‍රියා පොතේ 2:42-47 දක්වා වගන්තිවල වඩාත් සුපැහැදිලිව දක්වා තිබෙන අතර, ශු:පාවුලුතුමා අප විසින් දැරිය යුතු සාක්ෂියේ ස්වභාවය ගැඹුරු බව 1 තිමෝති 6 වන පරිච්ජේදයේ 11 පදයේ සිට සැකෙවින් දක්වා තිබේ. අපගේ ඇදහිල්ලේ ගමන සමිඳුන් උදෙසා සිදු කරන සටනක් වන අතර, එය නිර්භිතව හා අධිෂ්ඨාන වීර්යයෙන් සිදුකල යුතු අතර,පලමු කොරෙන්ති යැවුම් පත්‍රයේ සදහන් ආකාරයට තලෙන්ත වටිනාකම් ශුද්ධාත්මයාණන් විසින් ලබාදෙන ලදුව එම බලසතු කිරීම තුල අපගේ සේවය ප්‍රවර්ධනය කල යුතු වේ. වසර 150 ක් සපිරෙන කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථාන පළාත ප්‍රජාව උක්ත වටිනාකම හදුනාගෙන ශුද්ධාත්මයාණන්ගේ බලයේ පූර්ණ වූ ජනතාවක් ලෙස දුන් සාක්ෂිය සැබෑ ආදර්ශයකි. සැබෑ ආදර්ශයක් සමිඳුන් උදෙසා දැරීමට නම් ප්‍රජාව ඇදහිල්ලක් හා දිවි පරදුවට තබා සිදුකරන පරිත්‍යාගශිලි,විශ්වාසි, ආදර්ශයක් ලෝකයා අපගෙන් බලාපොරොත්තු වන බව අප වටහා ගැනිම වටී.

ගෞ. අනුරුද්ධ බණ්ඩාර පියතුමාද, එතුමා සමග ක්‍රිස්තු දේවස්ථානයේ ගිහි නිලධාරී මඩුල්ලද, සියලුම ජනී ජනයාද, ඒ වෙනුවෙන් සිදුකරන කැප කිරීම, මෙහෙවර අප සැබෑ ලෙස අගය කරන අතර, සභාවේ ඉදිරි මෙහෙවර අර්ථවත්ව අඛණ්ඩව ඉටුකිරීමට අප දෙවිඳුන්ගේ සරණ ප්‍රාර්ථනා කරමු. මෙම වසරෙහි අරඹන සෑම නව මෙහෙවරක්ම

සභාවේ ඇදහිලිවතුන්ගේ හා ප්‍රදේශයේ ප්‍රජාවගේ උන්නතිය උදෙසා සාක්ෂියක් වේවායි අපි පතමු. 150 වැනි සංවත්සරික දේව මෙහෙය හා ඉදිරි යුගය, සර්ව ප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ඉත සිතින් ප්‍රර්ථනා කරමු.

1 තෙසලෝනික 5 " එබැවින් ඔබ දැනටම කරන්නාක් මෙන් එකිනෙකාට ධෛර්ය දෙන්න එකිනෙකා ශක්තිමත් කරන්න.

ස්තුතියි
සමිඳුන් තුළ

වන්දනීය ජෝර්ජ් මෙල්ඩර් අනුනායක පියතුමා
ලංකා සභාව- කුරුණෑගල දියෝකීසිය



පාස්කු දින පූජාව 2021



වේ අණාදෙන නිලධර කපිතාන් ඩබ්ලිව්.ඩෝසන්ය. මේ අසරණයා මියගියේ මගේ අතෙහිය. මුළු දිවයිනම ඔහු වෙනුවෙන් ශෝකවිය. ඔහු ඇඳින සිටිය යමෙක්වීද ඔහු ඒ තැනැත්තාට බෙහෙවින් ඇලුම් කළේය. ඩෝසන්ගේ කනිෂ්ඨ තත්ත්වය ගැන නොසිතා රාජකීය ඉංජිනේරු හමුදාවේ අණාදෙන නිලධාරී පදවියට සර් එඩ්වඩ් බාන්ස් විසින් තෝරාගන්නා ලදී. ඔහුගේ කාර්යක්ෂමබවෙහි විශිෂ්ට ජයග්‍රහණයක් වූ කඩුගන්නාව දුර්ග මාර්ගය මුදුනේ ඔහු සිහිවීම පිණිස ස්මාරකයක් ඉදිකළේ ඒ හේතුවෙනි."
( ශ්‍රී ලංකාවේ පනස් වසරක්- විලියම් ස්කිනර්)

කඩුගන්නාව ගල් පර්වතය පුපුරා ඉවත්කර මාර්ගය තැනීමට හැකියාව තිබුණත් ඉංග්‍රීසින් එය කපා ඒ මැදින් පාර තැනුවේ උඩරට සිංහලයන් තුළ පැවති අභිමානවත් විශ්වාසයක් බිඳ දැමීමට බව පැවසේ. ගල විද පාර සැකසීමත් සමඟ ඒ විශ්වාසය බිඳ වැටී ඇත. එම විශ්වාසය නම් දළදාවහන්සේ හිමිකර ගන්නාතුරු හා ගලවිද කන්ද කපා උඩරටට පාරක් කපන තුරු උඩරට රාජධානිය ආක්‍රමණිකයන්ට අල්ලා ගැනීමට බැරි බව යි.

මෙම ගල විදපු ස්ථානයේ තිබෙන සමරු පලකයේ මෙසේ සටහන්කොට තිබේ.
"කොළඹ - මහනුවර මාර්ගය ඉදිකිරීම් භාරව කටයුතු කරනලද ඉංග්‍රීසී ජාතික ඉංජිනේරු කැප්ටන් විලියම් ෆ්‍රැන්සිස් ඩෝසන් විසින් ස්වාභාවික චමත්කාරයට හානි නොවන පරිදි මෙම අපූර්ව නිර්මාණය වර්ෂ 1828-1830 වර්ෂවල නිමකොට තිබේ."

ඩෝසන් කුලුන
කඩුගන්නාව දුර්ග මාර්ගයේ ඉහළ ම ස්ථානය වන්නේ ඩෝසන් කුලුන අසල ස්ථානය යි. එයට නුදුරින් කඩුගන්නාව නගරය පැතිර තිබේ. කැප්ටන් ඩෝසන් සිහිපත් කිරීමට ඉදි කළ මේ කුලුන අදත් ජනප්‍රිය මං සලකුණක්ය. ඩෝසන්ගේ මරණය හේතුවෙන් කොළඹ - මහනුවර මාර්ගයේ වැඩ අවසන් කළේ මේජර් තෝමස් ස්කින්නර්ගේ මූලිකත්වයෙනි. විශාල අභියෝග මැද තැනූ නුවර මාර්ගයේ වැඩ 1832 වසරේදී අවසන් කිරීමට හැකියාව ලැබුණි. එවකට පැවැතියේ බොරළු පාරක් මිස අද මෙන් කාපට් පාරවල් නොවේ. ඉන් පසු අශ්ව රථ මෙන්ම ගොන් කරත්ත ද මේ පාර

සම්පූර්ණ මාර්ගයේ ම අධීක්ෂණය බාර වුයේ කැප්ටන් විලියම් ඩෝසන්ට ය. නුවර මාර්ගයේ පළමු කොටස දිව යන්නේ බස්නාහිර තැනිතලාව ඔස්සේය. කොළඹ සිට අඹේපුස්ස දක්වා එහි මුල් කොටස ඉදිකිරීම සිදු විය. දෙවන අදියර අඹේපුස්සේ සිට කඩුගන්නාව දක්වා තැනීම විශාල අභියෝග මැද සිදු කළේය. වරකාපොළ සිට අඹන්පිටිය දක්වාවූ සැතපුම් එකොළහක දුර ප්‍රමාණයේ ඉදිකිරීම් මේජර් තෝමස් ස්කිනර්ගේ අධීක්ෂණය යටතේ සිදු කළේය. එම කොටස ඉදිකිරීමට සහභාගිවූ එවකට තරුණ ඉංජිනේරු මේජර් තෝමස් ස්කිනර් ලංකාවේ පනස් වසක් නම් කෘතියේ එහිදී විඳි දුෂ්කර ත්‍රාසජනක අත්දැකීම් විස්තර කර ඇත.

අලි, කොටි,  සර්පයන්, කූඩැල්ලන් වැනි සතුන් හමුවේත්, ඇළ, දොළ, ගංගා, ගිරිදුර්ග, වැනි බාධක මැදත් ඔවුන් නුපුහුණු කුලීකරුවන් සමඟ පාර කැපීම සිදු කළා. මැලේරියාව වැනි වසංගත රෝග මාර්ගයේ වැඩවලට විශාල බාධාවක්වුණු බව සඳහන් වේ.

මැලේරියාව නිසා ස්වදේශීය කම්කරුවන් මෙන් ම ඉංග්‍රීසි නිලධාරීන් ද මිය ගියේ ය.  කොළඹ- නුවර පාර තැනීමේ දී දුෂ්කර ම කොටස වුයේ කඩුගන්නාව දුර්ගය හරහා පාර කැපීම යි. ගල්පර්වත ඉවත්කරමින් දැඩිබෑවුම හරහා වනාන්තරය ඔස්සේ පාර තැනිය යුතු විය. මහවැස්සත් එයට නිතර බාධා කරන ලදි.

කැප්ටන් ඩෝසන්

පාර කැපීමට කැප්ටන් ඩෝසන් දිවා රාත්‍රී දෙකේ ම එක දිගට ම වෙහෙ-සුණු බව වාර්තා වල සඳහන් වේ. නුවර පාර කඩුගන්නාවට ආසන්න වුණු විට කැප්ටන් ඩෝසන් උණ රෝගය වැලඳීමෙන් අසාධ්‍ය විය. ඔහුට ප්‍රතිකාර කිරීමට කොළඹට රැගෙන ගියත් මරුවාගෙන් ඔහුට ගැලවීමට ලැබෙන්නේ නැත. කැප්ටන් ඩෝසන් වර්ෂ 1829 මාර්තු 28 වැනි දින කොළඹ දී  මරණයට පත් විය. කඩුගන්නාව දුර්ගයේ පිහිටි කළුගල විදතැනූ උමං මාර්ගය කැප්ටන් ඩෝසන්ගේ සංකල්පයකි.

ඔහුගේ මරණය ගැන මේජර් ස්කිනර් මෙසේ සටහන්කර ඇත.

"1829දී මගේ හිතෛෂී මිත්‍රයෙක් අභාවප්‍රාප්ත විය. ඒ සමඟම අගනා නිලධරයෙකුගේ සේවයද අහිමිවිය. ඒ වූ කලී රාජකීය ඉංජිනේරු හමුදා-







" එවිට ඔබේ තණ බිමේ බැටළුවෝ ද ඔබේ සෙනඟ ද වන අපි සදහට ම ඔබට ස්තුති කරන්නෙමු. පරපුරෙන් පරපුරට අපි ඔබට පැසසුම් කරන්නෙමු." ගීතාවලිය 79:13

කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානයට වසර 150 සපිරීම පිළිබඳව දෙවි සමිඳාණන්ට ප්‍රථම කොට ස්තුතිය පුද කරමි. මෙතරම් දීර්ඝ කාලයක් "ක්‍රිස්තු" නම ප්‍රදේශය පුරා ගෙන යන්නට කැපවූ රදගුරුතුමන්ලා, අනුනායකතුමන්ලා, දේවගැතිවරුන්, දහම් සේවක සේවිකාවන් හා ඇදහිලිවතුන් ගැනද දෙවිසමිදාණන්ට ස්තුති පූර්වක වෙමි.

සී. එම්. එස්. ධර්මදූත කණ්ඩායම මහනුවර සහ කඩුගන්නාව ප්‍රදේශයේ කල අමිල සේවයේ  ප්‍රතිඵලයක් ලෙස කඩුගන්නාව දේවස්ථානය බැප්ටිස්ට් මිෂනාරිවරුන්ගෙන් ලබාගෙන 1872 නොවැම්බර් මස 10 වන දින ක්‍රිස්තු දේවස්ථානය ලෙස කැප කර ඉදිරි සේවය සිදු කර ඇත. 1899 ජූලි 03 වන දින දේවස්ථානය ගොඩ නංවා දෙවිඳුන්ට කැප කර ඇත.

මෙම දේවස්ථානය සඳහා අතීතයේදී පැමිණියේ කඩුගන්නාව දුම්රිය ස්ථානයේ සේවය කරන මහත්ම මහත්මීන්, ඉංග්‍රීසි පාසල්වල ගුරු භවතුන්, වතු අධිකාරිවරුන්, ඉහල නිලතල දැරූ ඉංග්‍රීසි ආණ්ඩුවේ මහත්ම මහත්මීන් සහ  ප්‍රදේශයේ ජනතාවයි. මෙම කණ්ඩායම් නිතර මාරුවීම් හරහා ස්ථාවර පවුල් සංඛ්‍යාවක් එවක පටන් නොතිබුණු අතර එක් අවස්ථාවක දේවස්ථානයේ නැගීමද යම් යම් වකවානු වල පහල යාමද දැකිය හැකිය. පියතුමන්ලා සහ සහෝදරතුමන්/තුමියන් විශාල කැපකිරීම් සිදුකර මේ දේවස්ථානයේ සේවය කර ඇත. මේ වන විට දේවස්ථාන නමස්කාරය සඳහා කඩුගන්නාව ප්‍රදේශයේ ජීවත්වන ජනතාව පමණක් සහභාගී වේ. 2022 වර්ෂය වන විට පවුල් 17 ක් කඩුගන්නාව දේවස්ථානයට සම්බන්ධව කටයුතු කරයි. සාමාජිකයන් සංඛ්‍යාව 60 කි. දහම්පාසල් දරුවන් සංඛ්‍යාව 11 කි. ඉරුදින උදෑසන 7 ට නමස්කාරය සිදුකරයි.

මෙම දේවස්ථානයේ පළාතභාර පියතුමා ලෙස මා සේවය සඳහා පැමිණෙ-න්නේ 2021 ජනවාරි 01 වන දින සිටය. මීට පෙර සිටි පියතුමන්ලාද ඔවුන්ගේ උපරිම දායකත්වය මෙම දේවස්ථානය උදෙසා ලබා දී තිබූ නිසා ඉදිරි සේවය ඉතා පහසු විය. මා දේවස්ථානයේ පූජාවන් සඳහා රත්මීවල දේවගැති ගෘහයේ සිට පැමිණෙන අතර පෞරාණික දේවස්ථානයේ වහලය හා දේවස්ථාන ඇතුලත අබලන්වී ඇති බවත් එය වහා පිළිසකර කල යුතු බවත් ඇදහිලිවතුන්ගේ අදහස විය. ඇදහිලිවතුන්ගේ හා ටී. බී. ඒකනායක මහතා සහ පවුලේ අයගේ මුල්‍ය පරිත්‍යාගයෙන් ලක්ෂ 16 ක මුදලක් එකතුකර අද දවසේ ඔබ දකින දේවස්ථානය ප්‍රතිසංස්කරණය කිරීමට හැකිවීම ගැන දෙවියන්ට ස්තුති වෙමි. වැඩ නිම කරදීමට භාර ගත් අප දේවස්ථානයේ ලලිත් ප්‍රනාන්දු මහතාටද, ගිහි නිලධාරීන්ද, මෙම කාර්යයට විවිධ අයුරින් දායකත්වය සැපයූ සියලු ඇදහිලිවතුන්ටද, අපගේ කුරුණෑගල දියෝකීසියේ කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරුතුමන්ටද, වන්දනීය ජෝර්ජ් මෙල්ඩර් අනුනායකතුමන්ටද නන් අයුරින් උපකාර කල සියලු දෙනාටද ස්තුති වන්ත වෙමි.

150 වන සංවත්සරය සමරණ අප දේවස්ථානයට ජේසුගේ දෙවන පැමිණීම දක්වා මිනිසුන්ගේ හදවත් සුවපත්කර ඔවුන් සුදුස්සන් කරන්නට දේව ආශිර්වාදය නොඅඩුව ලැබේවා. ජේසු පිහිටයි.
මෙයට,

ගරු අනුරුද්ධ බණ්ඩාර පියතුමා
කඩුගන්නාව හා රත්මීවල දේවස්ථාන පළාත භාර පියතුමා





රථයකින් හෝ වෙනත් වාහනයකින් පහළ කඩුගන්නාව පසුකරගෙන, ඈත ක්ෂිතිජ ඉමේ පෙනෙන බතලේගල, ඌරාගල කඳු පන්තිය, අරණායක සාමසර කඳු පන්තිය, දෙවනගල පුදබිම හා එහි තුරු වදුලේ අසිරිය විඳගනිමින් ගමන් කරන අපිට අතීතයේ මේ දුර්ගය තුළ සිදුවූ ආක්‍රමණ, සටන්, එම සටන්වල තරම, ජය-පරාජය පිළිබඳ කිසිදු අදහසක් නැත. එසේම, කොළඹ-මහනුවර දුම්රියේ නැගී රඹුක්කන, කඩිගමුව, ඉහළ කෝට්ටේ, බලන දුම්රිය ස්ථාන පසුකර කඩුගන්නාව දුම්රිය ස්ථානය දක්වා භයංකාර දුර්ගයක අසිරිය විඳගනිමින් ගමන් ගන්නා අපට මේ දුර්ගය තුළ ඇති දෑ මෙන්ම, අතීතයේදී මේ තුළ සිදුවූ පෙර කී ත්‍රාසජනක සිද්ධීන් මතකයට එන්නේ නැත. හුදෙක් සෞන්දර්යය චාරිකාවක් පමණ-ක්ම වන කඩුගන්නාව හරහා ගමන විඩා නිවන, මනස සුවපත් කරන අගනා දර්ශන තලයක් ලෙස සලකනවා පමණක් මිස අප එහි වටිනාකම් සොයා යන්නේ නැත.

රජ කාලේ කොළඹ නුවර පාර

උඩරට රාජධානි කාලේ පටන් කොළඹ සිට මහනුවරට වැටී තිබුණේ කැලණි ගංගා නිම්නය ඔස්සේ විහිදුණු අඩිපාරකි. මේ මාර්ගයේ අශ්වයකු පිටේ ගමන්කිරීමට හෝ දෝලාවක ගමන් කිරීමටයි රාජ්‍ය නිලධාරීන්ට සිදුවුයේ. අවිස්සාවේල්ල -රුවන්වැල්ල හරහා මා ඔය නිම්නය දක්වාත්, එතැන් පටන් බලන කපොල්ල හරහා ගොස් මහනුවර දක්වාත් තිබූ මේ මාර්ගය දුර වැඩි වගේ ම දුෂ්කර බවින්ද අධික විය. එනිසා කරත්තවලට ගමන් කළ හැකි මාර්ගයක් මහනුවරට කැපීමට ඉංග්‍රීසි ආණ්ඩුවට අවශ්‍ය විය. ඒ කෝපි, තේ වැනි වාණිජ බෝග කොළඹ වරාය දක්වා පහසුවෙන් ප්‍රවාහනය කිරීමට යි.

කොළඹ - මහනුවර මාර්ගයේ ඉදිකිරීම් 1820 තරම් කාලය වනවිට ආරම්භ වී පැවතිණි. මෙරට මාර්ග ඉදිකිරීමට ඉංග්‍රීසින් ගෙන ගිය වැඩපිළිවෙළ අනුව කොළඹ සිට ප්‍රථමයෙන් ආරම්භ කළ මාර්ගය ලෙස නුවර පාර ඉතිහාසගත වේ. 1818 කැරැල්ලේ දී මහනුවරට පිවිසීමට පහසු මාර්ගයක් නොතිබීමේ අඩුව ඉංග්‍රීසි පාලකයකයන්ට තදින් දැනුණි. පළමු මාර්ගය නිසා එය අංක ගතකර ඇත්තේ ඒ -001 ලෙස යි. බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර සර් විල්මට් හෝර්ටන්ගේ මූලිකත්වයෙන් මෙම නුවර මාර්ගයේ ඉදිකිරීම් පටන් ගත්තේ ය.

**මනහර කඩුගන්නාව හා ඒ ආශ්‍රිත ඓතිහාසික පසුබිම**

කඩුගන්නාව යනු ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි නගරයකි. මෙහි දී පහත රට සිට මධ්‍ය කඳුකරයට පිවිසෙන්නේ රමණීය දර්ශනයක් ද නරඹමින්ය. කඩුගන්නාව කන්ද නගින විට දකුණු පසින් දිස-ʻවන්නේ සබරගමු කඳු පිහිටි කෑගල්ල දිස්ත්‍රික්කයේ පෙදෙස්ය. ඈතින් බතලේගල මෙන්ම දෙවනගල හා අම්බුලුවාව කන්දත් දැකගැනීමට හැකිවේ. කඩුගන්නාව නගරයට පෙර තිබෙන්නාවූ පහළ කඩුගන්නාව කෑගලු දිස්ත්‍රික්කයට අයත් කොටසකි. කඩුගන්නාව ඈත අතීතයේ සිට වැදගත් වන්නේ සතුරු ආක්‍රමණවලට දැක්වූ ප්‍රතිචාර හේතුවෙනි.

පෘතුගිසි, ලන්දේසි හා ඉංග්‍රීසීහු එදා උඩරට යටත් කරගන්නට උත්සහ කල සෑම අවස්ථාවකදීම පැරණි සීතාවක මාර්ගයෙන් හා කඩුගන්නාව දුර්ගය ඔස්සේ පැමිණ සිංහල හමුදාවට හා සෙංකඩගල රැකවලුන්ට පහර දුන්හ. සැබවින්ම මේ තුන් ජාතියටම උඩරට රාජධානිය යටත් කරගන්නට තිබුණු ලොකුම "හිසරදයක්" වූයේ කඩුගන්නාව යැයි කීවාට වරදක් නැත. එසේ වන්නට හේතුවක් වූයේ කඩුගන්නාව දුර්ගයේ රැ කවල්ලා සිටි සිංහල බලඇණි සතුරන්ට සැඟවී සිට දරුණු ප්‍රහාර එල්ල කිරීමය. මේ සඳහා ඔවුහු විවිධ උපක්‍රමද භාවිතයට ගනු ලැබූහ. ගල් පෙරළීම, දුනු විදීම, ලෝදිය හැලීම, උගුල් ඇටවීම වැනි උපක්‍රම මගින් සතුරු හමුදා පරලොව හැරියේ වරක් දෙවරක් නොවේ. සත්‍ය වශයෙන්ම කඩුගන්නාව දුර්ගය ඔස්සේ සතුරු ආක්‍රමණවලට මුහුණට මුහුණ සටන් කළ අපගේ සිංහල හමුදාවෝ කඩුගන්නාවේදී අවස්ථා කිහිපයකදීම උඩරට රාජ්‍යයට ජයග්‍රහණ අත්පත්කර දුන්හ.

මේ සඳහා සිංහල හමුදාව කඩුගන්නාවේ "බැලුම්ගල˜ නම් ස්ථානය ඔත්තු බැලීමේ කටයුතු සඳහා භාවිත කළ අතර, එහි "මහා බැලුම්ගල්" හා "කුඩා බැලුම්ගල්" ලෙස මුරපළ දෙකක් තිබූ බව අතීත තතු දත් අය කියයි. එසේම, සතුරන්ට මුහුණ දුන් ප්‍රධාන සිංහල හේවා කඳවුර හා තවත් ඔත්තු සේවා කඳවුරක් පිහිටා තිබුණේ කඩුගන්නාව දුර්ගයේ පසෙක බලන කපොල්ල තුළය. එය බලන බලකොටුව නම් විය. එනම්, කඩුගන්නාව දුර්ගයේ වැදගත් ප්‍රවිෂ්ඨ ස්ථාන සියල්ලක් ආවරණය වන පරිදි පුළුල් ප්‍ර දේශයක සිංහල හමුදා තම ආරක්ෂාව තහවුරු කරගෙන සිට ඇත. බස්



**சபை போதகர் வண. அநுருந்த பண்டார அவர்களின் ஆண்டு விழா செய்தி...............**



**"அப்பொழுது, உம்முடைய ஜனங்களும் உம்முடைய மேய்ச்சலின் ஆடுகளுமாகிய நாங்கள் உம்மை என்றென்றைக்கும் புகழுவோம்; தலைமுறை தலைமுறையாக உமது துதியைச் சொல்லிவருவோம்." (சங்கீதம் 79:13)**

கடுகன்னாவ கிறிஸ்து தேவாலயத்தின் 150 வருட நிறைவிற்காக கடவுளுக்கு முதல் நன்றி செலுத்துகின்றேன். இவ்வாறு நீண்ட காலம் கிறிஸ்து என்ற நாமத்தை பிரதேசம் முழுவதும் கொண்டு செல்ல உழைத்த அத்தியட்சகர்கள், குருமுதல்வர்கள், போதகர்கள், இறை ஊழியர்கள் மற்றும் விசுவாசிகள் அனை-வருக்காகவும் கடவுளுக்கு நன்றி கூறுகின்றேன்.

CMS மிஷனரி குழு கண்டி மற்றும் கடுனன்னாவ பிரதேசத்தில் செய்த உன்னத சேவையின் பலனாக கடுகன்னாவ தேவாலயம் பாப்டிஸ் (Babtist) மிஷனாரிகளிடமிருந்து 1872 நொவம்பர் மாதம் 10ஆம் திகதி கிறிஸ்து தேவாலயமாக பிரதிஷ்டம் செய்யப்பட்டு தொடர்ந்து பணியாற்றியுள்ளது. 1899 ஜுலை மாதம் 3ஆம் திகதி தேவாலயம் கட்டியெழுப்பி கடவுளுக்கு பிரதிஷ்டம் செய்யப்பட்டுள்ளது.

இந்த தேவாலயத்திற்கு கடந்த காலங்களில் கடுகன்னாவ புகையிரத நிலையத்தில் சேவை செய்தவர்கள், ஆங்கில பாடசாலைகளின் ஆசிரியர்கள், தோட்ட கண்காணிப்பாளர்கள், ஆங்கிலேயரின் ஆட்சியின் போது உயர்பதவி வகித்தவர்கள் மற்றும் பிரதேச மக்கள் ஆகியோர் வருகை தந்துள்ளனர். இவர்கள் அடிக்கடி இட மாற்றங்களை பெற்றமையினால் நிரந்தர குடும்ப அங்கத்தினர் தொகை இல்லாதிருந்ததோடு ஒரு சந்தர்ப்பத்தில் தேவாலயத்தின் எழுச்சி குறிப்பிட்டகால கட்டங்களில் வீழ்ச்சியடைவதை காணக்கூடியதாக இருந்தது. போதகர்கள் மற்றும் இறை பணியாளர்கள் மாபெரும் சேவையை இந்த ஆலயத்தில் செய்துள்ளார்கள். இன்று ஆலயத்தின் வழிப்பாட்டில் கடுகன்னாவ பிரதேசத்தில் வாழும் மக்கள் மட்டும் கலந்துக் கொள்கிறார்கள்.

2022ஆம் ஆண்டில் 17 குடும்பங்கள் கடுகன்னாவ ஆலயத்தில் இணைந்து செயற்படுகின்றன. அங்கத்தினர் தொகை 60 ஆகும். ஓய்வுநாட் பாடசாலை பிள்ளைகளின் எண்ணிக்கை 11 ஆகும். ஞாயிறு ஆராதனை காலை 7 மணிக்கு நடைப்பெறும்.

நான் 2022 ஜனவரி மாதம் 1ஆம் திகதி இந்த தேவாலயத்தின் சபை போதகராக வந்தேன். இதற்கு முன் இருந்த போதகர்கள் அவர்களின் முழுமையான ஒத்துழைப்பை வழங்கியதால் தொடர்ந்து பணியாற்றுவது மிகவும் இலகுவானதாகும். நான் ஆலய வழிப்பாட்டுக்காக ரத்மீவல குருமனையில் இருந்து வருகின்றேன். பழைய ஆலயத்தின் கூரையும், உட்புறமும் உடைந்து இருப்பதனால் அவற்றை திருத்த வேண்டும் என்பது விசுவாசிகளின் யோசனையாக இருந்தது. விசுவாசிகள் மற்றும் திரு. T.B. ஏக்கநாயக உட்பட அவரின் குடும்பத்தினரின் நிதி நன்கொடை 1.6 மில்லியன் ரூபா சேகரிப்பில் இன்று நீங்கள் காணும் ஆலயத்தினை புனரமைக்க இயன்றமைக்காக இறைவனுக்கு நன்றி செலுத்துகின்றேன். வேலையை முடித்துக் கொடுப்பதற்கு பொறுப்பேற்றுக் கொண்ட எமது ஆலயத்தின் திரு. லலித் பெனண்டோ, சபையின் மூப்பர்கள் மற்றும் இதற்கு பல்வேறு முறைகளிலும் தமது ஒத்துழைப்பினை வழங்கிய அனைத்து விசுவாசிகள், குருநாகலை அத்தியட்சகர் கீர்த்திசிரி பெனண்டோ, குரு முதல்வர் ே ஜாஜ் மெல்டர் மற்றும் வேறு உதவிகளை வழங்கிய அனைவருக்கும் நன்றி தெரிவிக்கின்றேன்.

150ஆவது விழாவினைக் கொண்டாடும் எமது ஆலயம் கிறிஸ்துவின் இரண்டாவது வருகை வரை மக்களின் மனதை குணமாக்கி அவர்களை தகுதியுடையவர்களாக்க தேவ ஆசீர்வாதம் குறையாது கிடைப்பதாக. கடவுள் ஆசீர்வதிப்பாராக.

இப்படிக்கு,
வண. போதகர் அநுருத்த பண்டார
கடுகன்னாவ, ரத்மீவல சபை போதகர்



පිළිබඳව එතුමන්ට තුති පුදමු. සිංහල, දමිළ හා ඉංග්‍රීසි භාෂාවන් කතාකරන සමූහයකගෙන් සැදුම් ලත් මෙම සභාව අද දක්වාම භාෂා තුනම භාවිත කරමින් එක්සත්ව එක්සිත්ව නමස්කාර කිරීම ඉතාම වටිනා ආදර්ශයකි. එමෙන්ම ලංකා දේවධර්ම ශාස්ත්‍රාලයේ පුහුණුව ලබන සිසුන්ටද මෙම දේවස්ථානයේ සේවා කටයුතු වලට සහභාගි වීම තුළ සුවිශේෂී අත්දැකීමක් ලබාගැනීමට හැකිව තිබේ.

2018-2020 කාල වකවානුව තුළ මෙම දේවස්ථානය භාරව සේවය කිරීමට මා හට ලැබුන අවස්ථාව පිළිබඳවද මා දෙවිඳුන්ට ස්තුති කරන අතර සභාවේ සාමාජික සාමාජිකාවන්ටද මා තුති කරනු කැමැත්තෙමි. එමෙන්ම කඩුගන්නාවේ නගර මධ්‍යයේ පිහිටි මෙම දෙව්මැදුරට ඉරුදින නමස්කාරය සඳහා බොහෝ අමුත්තන් සහභාගි වීම දැකිය හැකිය. ඊට හේතුව කොළඹ සිට මහනුවරට යන එන බැතිමතුන් දේව මෙහෙයට සහභාගි වීමයි.

මෙම සංවත්සරය සමඟ ඉදිරිය ගැන කල්පනා කොට ඉදිරි සැලසුම් සකස් කරමින් මෙම දේවස්ථානය තවතවත් ආකර්ෂණීය ස්ථානයක් බවට පත් කිරීමටත් මෙම ප්‍රදේශයට කිතුනුමන්ගේ ශුභාරංචිය ගෙන යන මධ්‍යස්ථානයක් බවට පත් කරගැනීමටත් හැකි වේවායි ප්‍රාර්ථනා හා යාච්ඤා කරමි.

වන්දනීය නිමල් වික්‍රමරත්න පියතුමා



## සම්මාන අනුනායක නිමල් වික්‍රමරත්න පියතුමා ගේ පණිවිඩය



කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානයේ 150වන සංවත්සරය වෙනුවෙන් ශුභාශිංසන පණිවිඩයක් එවීමට ලැබීම පිළිබඳව මා ඉතාමත් සතුටුවෙමි.

ආරම්භයේ පටන් මෙම දෙව් මැඳුරේ සේවය රත්මීවල, ක්‍රිස්තු රාජේශ්වරයාණන්ගේ දෙව් මැඳුර භාරව සේවය කළ දේවගැති තුමන්ලා වෙත පැවරුන අතර අද දක්වාම එය ඒ අයුරින්ම පවත්වාගෙන යනු ලැබේ.

වසර 1945 දී මෙම දේවස්ථානය භාර පියතුමා ලෙස අතිගරු ලක්දාස ද මැල් සහායක රදගුරු තුමා සේවය කරන ලදී. CMS පූජකවරුන් විසින් ඉංග්‍රීසි හා සිංහල භාෂා වලින් දේවමෙහෙයන් පවත්වන ලද අතර TCM පූජකවරුන් විසින් දමිළ භාෂාවෙන් දේවමෙහෙයන් පවත්වන ලදී. එමෙන්ම මෙම කාලය තුළ කැපී පෙනුන ගිහි නායකත්වයක් දක්නට ලැබුණ අතර වොලී බවස් මහත්මිය, විලී හර්මන් මහතා, ලීන් දසනායක මහතා යන අය ප්‍රධාන වේ.

1951 දී මෙම ක්‍රිස්තු දේවස්ථානය කුරුණෑගල දියෝකීසිය යටතට පවරන ලද අතර 1956-1961 අතර කාලයේ සේවාවන් පිළිබඳ එතරම් තොරතුරු සොයාගැනීමට අපහසු වී තිබේ. මෙම කාලය තුල රත්මීවල දේවස්ථානයේ සේවය කළ පූජකතුමන්ලා විසින් මෙම දේවස්ථානයේ සෙ- 'වාවන් ඉටු කරන්නට ඇතැයි විශ්වාස කල හැකිය.

1961 බ්‍රයන් තිරිමාන්න පියතුමාණන් විසින් නැවතත් මෙම සභාව තුල සේවාවන් ක්‍රියාශීලී අන්දමින් ඉටු කළ අතර ගරු. සෑම් සිල්වා පියතුමා, A. R. ඩයස් අබේසිංහ පියතුමා, P.V. කොයිල්පිල්ලේ පියතුමා, J. V. දේවදාස් පියතුමා හා D. J. කනගරත්නම් පියතුමා යන පියතුමන්ලා මෙම දේවස්ථානය භාරව සේවය කර ඇත.

මෙවන් දිගු ඉතිහාසයක් ඇති මෙම ක්‍රිස්තු දේවස්ථානය 150 වන සංවත්සරය සමරන මේ වසර ඉතා වැදගත් වේ. මෙහිදී අප වසර 150ක දිගු ගමනක් දෙස ආපසු හැරී බලා දෙවිඳුන් ගෙන් ලත් මහත් ආශිර්වාද



## ශුභාශිංසන වදන් පෙළට එකතු වන ඉතිහාසයේ බිහිසුණු ම සන්ධිස්ථානය ගැන ජයනාත් පණ්ඩිතරත්න පියතුමා තම හඬ අවදි කරයි.



කිතුනු වන්දනා මඟෙහි 150 වන විය සමරන කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානයට, එහි ප්‍රධාන පියතුමන්ට සහ සහික ඇදහිලිවන්ත සැදැහැවතුන්ට මාගේ උණුසුම් ශුභාශිංසන පුද කරන්නෙමි. මහෝත්තම දෙවි සමිඳාණන් හට සියලු ගෞරවය හා ප්‍රශංසාව හිමි වේවා.

කොළඹ - නුවර මහා මාර්ගය විශිෂ්ට ලෙස සැලසුම් කර නිමා කළ සුදු අධිරාජ්‍යයෝ ඩෝසන් නම් වන මහා ඉංජිනේරු ශිල්පියාණන් සිහිපත් වන ඓතිහාසික ඩෝසන් කුලුන පාමුල පිහිටි කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානය සැබවින්ම දේව මඟ ජන සමීපයට ගෙනා දූතමය මෙහෙවරට දෑත් විහිදූ කිතුනු මං පෙතක් යයි කීවොත් නිවැරදිය. කොළඹ සිට නුවර බලා එන ගමනේදී හිඟුල සිට ක්‍රම ක්‍රමයෙන් නැග ගෙන එන කන්ද මුදුණටම පැමිණ, අසීරු කන්දක් නැගීමෙන් විඩාව නිමා වන තැන, සියලුම වාහනවල එන්ජිම් වලට මහත් අස්වැසිල්ලක් දෙන ස්ථානයේ මෙම දේවස්ථානය පිහිටා තිබීම ඇත්තෙන්ම මහත් තේරුමක් ගෙන දෙන්නකි. අවට මනස්කාන්ත කඳු වැටි පෙළ සහිත පරිසරය සිතට කයට මහත් සුවයක් ගෙන දෙන බව නොරහසකි. තවද දීර්ඝ දුර ප්‍රමාණයක් කන්ද නැගීමෙන් ඇති වන වෙහෙස නිවා ගන්න ට නතර වන තැන ආත්මික හුස්ම ගැනීමට ගොඩ වැදීමට පුලුවන් වන සේ මෙම දේවස්ථානය පාර අයිනෙන්ම පිහිටා තිබීම ගමන් කරුවන්ට ඉමහත් ප්‍රයෝජනයක් අත් පත්ව තිබූ බව නොරහසකි.

ඉංග්‍රීසි සහ දමිළ මාධ්‍යයෙන් ද පසු කාලයේ සිංහල මාධ්‍යයෙන් ද ඇංග්ලිකානු සභා සම්ප්‍රදායට අනුකූලව දිව්‍ය පූජාවන් පැවැත්වූ මෙම දේවස්ථානය බොහෝ කාලයක්ම කොළඹ දියෝකීසියේ පාලනය යටතේ පැවති බව පැහැදිලිය. තවද කුරුණෑගල දියෝකීසිය ස්ථාපිත වීමෙන් පසුව කුරුණෑගල රදගුරු හිමියන් යටතට මෙම දේවස්ථානය පත් වූ අතර, කෘත හස්ත දේව සේවකයන් ගණනාවක්ම ඉතා ක්‍රියා ශීලි දේව සේවයක් මෙම දේවස්ථාන සභාව මූලික කර ගෙන ක්‍රියාත්මක කොට ඇත.

පසු කාලයේ මෙම දේවස්ථානයේ සේවයට පැමිණි කෙනකු මෙය තමන්ගේ පුද්ගලික දේපළක් ලෙසට මෙය පරිහරණය කිරීම හේතුවෙන් මෙය කුරුණෑගල දියෝකීසියට ඇතුල් විය නොහැකි ලෙස කටයුතු සලසා ගෙන තිබුණ බව අවට ජනයා ද, සභික ජනතාව ද සාක්ෂි දරති. මේ හේතුවෙන් මෙයට සම්බන්ධව සිටි සභික ජනතාව මහත් අසරණ තත්වයකට පත්වූ අතර, දේව නමස්කාරය පවා දියෝකීසිය අනුමත නොකළ කණ්ඩායමක් අතට පත්ව තිබිණි.

මේ තත්වය හේතුවෙන් කුරුණෑගල දියෝකීසියට ඇති හිමි කම් අහුරා පුද්ගලික පරිහරණයකට මෙය පාවිච්චි කිරීම අනුමත නොකළ නිසා සභික ජනතාවද සිත් බිඳී දේවස්ථානයෙන් ඈත් වන්නට පටන් ගත්හ. මෙම ක්‍රියාදාමයේ උච්ඡතම අවස්ථාව වූයේ මෙම ක්‍රියාවන් වලට එරෙහිව මා නායකත්වය දුන් 2006 වසරේ සිට බව කීවොත් නිවැරදිය.

කුරුණෑගල දියෝකීසියේ රදගුරු තුමන් පත් කරන ලද කිසිම පූජක වරයකුට මෙම දේවස්ථානයට ඇතුල්වීමට ඉඩ නොදුන් හෙයින් මෙය දියෝකීසියට අමතර හිසරදයක් බවට පත්වූ විසඳා ගත නොහැකි ගැටලුවක් බවට දීර්ඝ කාලයක් පත්ව තිබුණි.

මේ සියලු කාරණා එලෙසම තිබියදී එවකට කුරුණෑගල රදගුරු තුමන් වන අති ගරු කුමාර ඉලංගසිංහ රදගුරු හිමි විසින් මෙම දේවස්ථානයට මා පත් කලේ 2006 වසරේදී ය. එම පත් කිරීම මෙම දේවස්ථානය දියෝකීසිය භාරයට නැවත අත් පත් කර ගැනීමට මාර්ගයක් වූ බව කීම අතිශයෝක්තියක් හෝ මුසාවක් නොවන බව සැම දෙනාම දනිති.

කෙසේ වෙතත් එම වර්ෂ කිහිපය අපට ඉතාම කටුක වූ බවද නොරහ-සකි. අප කිසිවකුට දේවස්ථානයට ඇතුල් වෙන්නට පවා ඉඩ නොදී මහත් දාමරික ලෙස කටයුතු කිරීම හේතුවෙන් අප සභිකයින්ගේ නිවෙස් වල ඉරු දින පූජාවන් සඳහා රැස් වුනෙමු. නත්තල් පූජාවත්, නත්තල් උත්සව වැඩ සටහනත් අපි මුදලිවත්ත ග්‍රාමය මුල් කර ගෙන එහි ප්‍රජා ශාලාවේ පැවැත්වීමු. දේවස්ථාන මංගල්‍යය සහ රදගුරු නිල සංචාරය සහ ස්ථිර කිරීම සිදු කරන්නට අපට දේවස්ථානය ලබා



all today in this grand celebration it certainly brings much joy. To Rev Anuruddha, the Wardens and all Parishioners my heartfelt prayers and best wishes on this celebration. May God guide us all in the work of this parish in the future and may God's Spirit empower you individually and as families to witness in God's vineyard always centering our task on the life of Our Lord Jesus.

R T B Abeysinghe (Rev)
Theological College of Lanka
Pilimatalawa
Feast of the Holy Cross 2022



තේ වත්ත බැසිලිකාව ඉදිරිපිට 2021



නත්තල් වැඩසටහන 2021

their own challenges coming for worship, bearing each other up and doing the very best towards the ministries in the parish. This is certainly the best example for fellowship. We are only a part of multitudes of persons who have been nourished by this parish over one and a half centuries. And here we must remember, thank and pray for their lives in committed service which have left us as the next generations of flag bearers.

Finally it is now time as clergy and as parishioners to plan the future ahead. We must make space for new ministries and new expressions of service. Being in Kadugannawa city for this many years have inevitably made impressions on the life and community in the city. Now it is time to make our presence felt, I would encourage you all to think of a few outreach ministries and developmental tasks that will affect many more than our own congregation. It is time to empower youth in our own parish to become ready for leadership in context. As a parish and community of God we must be part and parcel of the change this country is calling for, we must unite with other religious and secular organizations in this task. Our Diocese and the Church of Ceylon have always emphasized on unity, advocacy and nation building . These values must be now initiated in our own parish. And for this task we as the community outside are evermore ready to assist this work.

Some of my fondest memories in my early stages of priesthood are in Kadugannawa. I remember the love and cordiality that was showered upon me and many ministers and theological students who have journeyed on in this house of prayer. I thank God for the opportunity and experience that I underwent in this wonderful parish. When I see you



නොදුන් නිසා කඩුගන්නාව රෝමානු කතෝලික දේවස්ථානය වන ශා.සේවියර් දෙව් මැඳුර ඒ සඳහා ලබා දීමට එහි පියතුමා ඉමහත් කාරුණිකත්වයක් දැක්වූ අතර, අප අද ද එය සිහි කරන්නේ යටහත්ව කෘතවේදී ව ය. එදින අපගේ වාහන වලට පවා හානි කිරීමට සතුරු කණ්ඩායම ක්‍රියා කලහ.

මේ කටයුතු මෙලෙස සිදුවෙද්දී සියලුම සභිකයින්ගේ අත්සන් ඇතිව මහනුවර දිස්ත්‍රික් අධිකරණයේ මා විසින් නඩුවක් ගොනු කළ අතර, මෙම අධික වෙහෙසකර කාර්යයට මා දැඩි කැපවීමෙන් යුතුව කටයුතු කිරීම හේතුවෙන් යුද්ධයක් බඳුවූ මෙම සිද්ධි දාමය දේව උදව්වෙන් පරාජය කර සතුරු ග්‍රහණයෙන් මෙම ඓතිහාසික දේවස්ථානය මුදවා ගැනීමට සමත් වූයෙමි. මේ සඳහා මා හට දිවා රෑ වෙහෙස නොබලා සහය දැක්වූ සභික ජනතාව මා හට කිසි දා අමතක කළ නොහැකිය.

වැඩිකල් නොගොස් උසාවි තීන්දුව අප හට පක්ෂව ලැබීම හේතුවෙන් පිස්කල් මාර්ගයෙන් දේවස්ථානය අවුරුදු ගණනාවකට පසුව නැවත අප හට ලබා ගැනීමටත්, පූජා වත් පිලිවෙත් හා නමස්කාර මෙහෙයයන් අපගේ මූලිකත්වයෙන් යථාවත් කිරීමටත් අපට හැකිවූ බව පවසන්නේ දෙව් සමිඳුන්ට මහත් තුති සිතින් යුතුවය.

ප්‍රිය සැදැහැවත්නි, අද මෙසේ ඔබ සැමට අභිමානයෙන් මෙම 150 වන සංවත්සරය පවත්වන්නට හැකිව තිබෙන්නේ මාත් සමග නොයෙකුත් නින්දා අපහාස ඉදිරියේ නොසැලී සිටි සභික ජනතාව කළ විප්ලවයයේ ප්‍රතිඵලයක් ලෙසය. බොහෝ වාර ගණනාවක්ම උසාවියට යෑමට සිදුවූ මා හට ඒ සියලු කටයුතු වලදී මා සමග සෙවනැල්ලක් ලෙස සිටි දියෝකීසියේ දේපළ කටයුතු භාරව සිටි ලංකා ගම්මුදලි මහතාගේ අනුපමේය සහාය මට කිසිදා අමතක කළ නොහැකි බව සටහන් කර තැබීම වටී.

අද දවසේ මෙම නඩු කාර්යයේ ඉතුරුව තිබෙන කාරණය වන දේවස්ථානය සතු අනෙකුත් ගොඩනැගිලි හා දේපළ ද මා ඉදිරිපත් කල නඩුවටම අදාල කොටසක් වන අතර, මහෝත්තම දෙව් පියාණන්ගේ අති මහත් වික්‍රමාන්විත උපකාරාත්මක හස්තය කරණකොට ගෙන අයුක්ති සහගත කරුණු මැඩ සියලු ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වීම ගැන

අපගේ දෙවිඳුන්ට සිත පුරා මුව පුරා ස්තුති ප්‍රශංසා කිරීම හැර වෙනත් කාර්යයක් මෙම උතුම් දිනයේදී අප හට ඉතිරිව නැති බව පසක් කරනු කැමැත්තෙමි.

කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානය තුලින් අවට ජන ප්‍රජාව අධ්‍යාත්මිකව ශක්තිමත් කිරීමට දෙවි සමිඳුන්ගේ අනුහස් බලය එදා මෙන්ම අද ද ඉදිරි කාලයේ දී ද නොඅඩුව ලැබෙන බව අපට සක් සුදක් සේ පැහැදිලි ප්‍රත්‍යක්ෂ කරුණකි. ඔබ සැමට ජේසු පිහිටයි.
ආදරැති පියතුමා,

ගරු ජයනාත් පණ්ඩිතරත්න පියතුමා
ප්‍රධාන පූජක
ශු. ලූක් තුමන්ගේ දේවස්ථානය මාම්පේ පිළියන්දල සහ
ශු. මත්තියස් තුමන්ගේ දේවස්ථානය බොරලැස්ගමුව.
2022 ඔක්තෝබර් මස 06 වන දින දීය.



විශේෂ නමස්කාරයකදී 2021



**My best wishes for the 150th anniversary - Rev. R T B Abeysinghe**



Dear Friends of Christ Church Kadugannawa,
It is with great pleasure and privilege that I write these words on the Sesquicentennial Anniversary of our parish.
First and foremost this celebration is a testament to the promise we find in the epistle to the Philippians where we hear the reassuring words that ' God will bring into fulfillment all what God begins, in the day of our Lord'. There might have been times where we would have felt this parish was going through hard and rough experiences, yet we are celebrating a wonderful milestone with everyone in the parish, community and diocese gathered together. We must join the lyricist in the hymn Blessed Assurance by singing ' This is Our story, This is Our song, praising Our Saviour all the day long'. We did and must always keep our praise and worship at the front and leave everything else to a God. That is Christian witness and modeling of our faith.

One area I especially strived to focus on and encourage was community building in our parish. Our greatest strength lies in the relationship and fellowship of all our members. In the above time phases of challenge we concentrated more on what our witness should be rather than on things we cannot control. Each parish must resemble the goodness and love of God explaining to everyone that this is the precursor to the Kingdom of God. Our is a unity and togetherness that must transcend all secular barriers and must first and foremost imitate the life of our Lord in life and ministry. I am so encouraged in my own ministry to see great women and men of this parish with

## ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමාගේ ශුභාශිංසනය



ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රිය සහෝදර සහෝදරියනි,
කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථානයට වසර150ක් පිරීම නිමිති කොටගෙන එළිදක්වනු ලබන සමරු කලාපයට පළාත් භාර පියතුමකු ලෙස අවස්ථා දෙකක දී සේවය කළ මා හට සුභාශිංසන එවීමට අවස්ථාව ලැබීම ගැන දෙවියන් වහන්සේට ස්තූතිය පුද කරන අතර එය ඉමහත් ප්‍රීතියකි. වසර 150 කටත් එපිට සේවා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රිස්තු දේවස්ථානයෙන් අවට ප්‍රජාවට සිදු වූ ආගමික හා සමාජයීය සේවාව ගැන සතුටු වෙමි. මෙම කාල පරාසය තුළ සේවයේ නියැලුණු සියලු දේව සේවක සේවිකාවන් හා කැප වී ක්‍රියා කළ ගිහි ජනතාව ගැන දෙවිඳුන්ට ස්තුති පුදමි. මා සේවයේ නියැලෙන විට මා හා සේවයේ පංගුකාරීත්වය දැරූ පිළිමතලාව ලංකා දේවධර්ම ශාස්ත්‍රාලයේ ලංකා සභාව, මෙතෝදිස්ත හා බැප්ටිස්ට් සභාවන් නියෝජනය කළ සියලුම සහෝදර සහෝදරියන් දේවගැතිවරුන් හා වරියන් ස්තුති පූර්වකව මතක් කරමි. මෙහිදී සභාවට ඉතාමත් ළැදිව ක්‍රියා කළ දැන් සමිඳුන් තුළ සැතැපී සිටින ගිහි නායකයෙකු වූ මහසෙන් කොතලාවල මහතා මා සේවයට පැමිණි ප්‍රථම දිනයේ දී මාගෙන් ඉංග්‍රීසි බසින් ඔහු ඇසූ පැනය මතක් කරමි. "පියතුමනි ඔබ මේ දේවස්ථානයට අවසාන ඇණයක් ගසන්නටද ආවේ" යන අභියෝගාත්මක වදනයි. මා සිනාසී ඔහුගේ දෑත් අල්ලාගෙන අපි එම ඇණ ගලවමු යි පවසමින් ඔහු හා සභාව එක්ව නැවත ගොඩනැගීමේ සුවිශේෂ කාල වකවානුවක් ගත කිරීමට ලැබීම ගැන දෙවිඳුන්ට තුති පුද කර සිටිමි.

කඩුගන්නාව ක්‍රිස්තු දේවස්ථාන සමූහය කුඩා පිරිසක් වුවද එම සමූහය අප රටේ ජාතික සමගියේ සංකේතයකි. එනම් සිංහල, දමිළ, බර්ගර් ප්‍රජාවන් නියෝජනය කරන සමූහයක් ලෙස ඔවුන් තුළ තිබෙන එකමුතුව, කැපවීම් ගැන දෙවිඳුන්ට ස්තුතිය පුදන අතර වර්තමානයේ ගරු පළාත් භාර අනුරුද්ධ පියතුමා සමඟ එය වඩාත් ප්‍රබුද්ධ මට්ටමෙන් පවත්වා ගෙන සමස්ත ශ්‍රී ලාංකීය සමාජයටම ආදර්ශයක් දෙන කිතුනු සභාවක් වීමට දෙවිඳුන් යදිමි. ජේසු පිහිටයි.
ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමා
මහනුවර වසම් නායක, පළාත් භාර දේවගැති,
ගැටඹේ ශුද්ධ යොහාන් තුමාගේ දේවස්ථානය හා
කටුකැලේ ශුද්ධ මාර්ක් තුමාගේ දේවස්ථානය



**දේවස්ථාන ආරම්භයේ සිට අද දක්වා සේවය කල පියතුමන්ලා සහ දහම් සේවක සේවිකාවන්** ( දේවස්ථාන ලිඛිත තොරතුරු අස්ථාන ගතවී ඇති හෙයින් සමහර නම් මෙහි සඳහන් වී නොමැත බව කරුණාවෙන් සලකන්න)

ඉතිහාසයේ සේවය කල පියතුමන්ලාගෙන් කිහිප දෙනෙක්
1945 අතිගරු ලක්දාස ඩි මෙල් රදගුරුතුමා,

1951-1972 වර්ෂවලදී
ගරු ඒ. ආර් ඩයස් අබේසිංහ පියතුමා, ගරු ටී. ජී. අබේසිංහ පියතුමා
ගරු බ්‍රයන් තිරිමාන්න පියතුමා 1961-1965, ගරු පී. වී. කොයිල්පිල්ලෙයි පියතුමා, ගරු ජේ. වී. දේවදාස් පියතුමා, ගරු මෙසියා දාස් පියතුමා, ගරු ඩී. ජේ. කනගරත්නම් පියතුමා, නල්ලතම්බි පියතුමා, සිඩ්නි නයිට් පියතුමා, ගරු සෑම් ඩි සිල්වා පියතුමා

2006- 2009 - ගරු ජයනාත් පණ්ඩිතරත්න පියතුමා
2009- 2013 - ගරු රෝහණ රාජපක්ෂ පියතුමා
2012 - 2013 - ගරු රසික අබේසිංහ පියතුමා (සහයක පියතුමා)
2014 - 2015 - ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමා
2016 - ගරු රසික අබේසිංහ පියතුමා
2017 - ගරු නිශාන්ත ප්‍රනාන්දු පියතුමා
2018-2020 - වන්දනීය නිමල් වික්‍රමරත්න පියතුමා
2021 සිට ඉදිරියට - ගරු අනුරුද්ධ බණ්ඩාර පියතුමා

සේවය කල දහම් සේවක සේවිකාවන්ගෙන් කිහිපදෙනෙක්
මල්ලිකා එඩ්වඩ්ස් සහෝදරතුමිය
දුමින්ද ජයසිංහ සහෝදරතුමා
මල්ලිකා විජේරත්න සහෝදරතුමිය
මැටිල්ඩා විලියම්ස් සහෝදරතුමිය
කුමුදුනී අබේසිංහ සහෝදරතුමිය

යම් යම් වකවානුවල විවිධ පියතුමන්ලා හා දේවධර්ම ශිෂ්‍යයන් ඉරු දින පූජාවන් හා ආගමික කටයුතු වෙනුවෙන් සහය ලබා දී ඇත.

**ගරු රෝහණ රාජපක්ෂ පියතුමාගේ සුබ පැතුම්.....**



මහනුවර බන්ධනාගාරයේ දඬුවම් විඳිමින් සිටි රත්මීවල මහාදමරිකයා 1838 වෙනි වර්ෂයේ ජුනි මස 3 වෙනි ඉරු දින මහනුවර දේවස්ථානයේදී ආබ්‍රහම් නමින්, ගරු විලියම් ඕක්ලි දේවගැති තුමා විසින් බව්තිස්ම කරනු ලැබිම ගරු ඕක්ලි දේවගැති තුමාටත්, ඕක්ලි මහත්මියටත් මහනුවර ක්‍රිස්තියානි සභාවටත් මහත් ප්‍රීතිදායක අවස්ථාවක් විය. ඉක්බිති රත්මීවල ක්‍රිස්තු රජාණන්ගේ දේවස්ථාන සභාව කාලයාගේ ඇවෑමෙන් ආරම්භ විය. එම කාලයේ මහනුවර මධ්‍යම සංචාරක සේවය විලියම් ඕක්ලි දේවගැති තුමා භාරයේ පැවතුණේය. එතුමා වසර පනහක්ම මෙම ධර්මදූත සේවයෙහි යෙදී ඇත. මෙම කාලය තුළදී කඩුගන්නාව ක්‍රයිස්ට් චර්ච් සභාවේ කටයුතු කෙරුණේ රත්මීවල සභාව භාරව සිටි දේව සේවකයන්ගෙන්මය. අති ගරු ලක්දාස ද මෙල් සහායක බිෂොප් තුමා 1945 දී පමණ කඩුගන්නාව පදිංචිව සිටිමින් රත්මීවල සභාවේ සේවය කළ බවද සඳහන්ව ඇත.

මෙම කඩුගන්නාව ක්‍රිස්තු සභාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් දේව මෙහෙයක් පවත්වන එක් අංශයක් වූ අතර තවත් අංශයක් වූයේ දෙමළ මාධ්‍යයෙන් මෙහෙයන් පවත්වන ද්‍රවිඩ සභාවක්ය. සිංහල ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පවත්වාගෙන පැමිණ දේව මෙහෙයක් චර්ච් මිෂනාරි සමාගමේ දේව ගැතිවරුන් පාලනය කළ අතර දෙමළ දේව මෙහෙයන් පවත්වාගෙන ආවේ දෙමළ ධර්මදූත සේවයෙනි. මෙම ක්‍රමය 1950/51 වර්ෂයේ කුරුණෑගල දියෝකීසියටම සම්පූර්ණයෙන්ම භාරදෙනු ලැබ ඇත.

1951 සිට 1956 වනතෙක් නොකඩවා සිංහල ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් දේව මෙහෙයයන් පවත්වාගෙනවිත් ඇති නමුත් එයින් පසුව මෙම සභාවේ සේවය ක්‍රියාත්මක වන බව පෙනෙන්නට ඇත්තේ 1961 සිට 1965 වන තෙක් ගරු බ්‍රයන් තිරිමාන්න දේවගැති තුමාගේ කාලයේ ය. එතැන් සිට මේ දේවස්ථාන සභාව ක්‍රියාත්මක වූ බවත් දියෝකීසිගේ වාර්ෂික වාර්තාවල සොයාගත නොහැකිය.

කඩුගන්නාව ක්‍රිස්තු සභාව දෙමළ ධර්මදූත ව්‍යාපාරයෙන් සහ කොළඹ



දියෝකීසිගේ ධර්මදූත සේවා මණ්ඩලයෙන් පාලනය වී ඇති අතර කුරුණෑගල දියෝකීසියට සම්බන්ධවූවාට පසුවත් කලක් පරණ පාලනයෙන්ම ක්‍රියාවේ යොදවා ඇත. මේ කාළය තුළ ගරු පී.වී. කොයිල්පිල්ලෙයි. ගරු ජේ. වී. දේවදාස්, ගරු මෙසියා දාස්, ගරු ඩී. ජේ. කනගරත්නම් යන දේවගැති තුමන් 1951 සිට 1972 වන තුරුම සභාවේ සේවය කර ඇත. එම කාලය තුළ කඩුගන්නාව දෙමළ පාඨශාලාවේ ප්‍රධානාචාර්ය ජේ.ආර්. සත්‍යානාතන් සහ රත්නනායගම් යන මහත්වරු කුරුණෑගල දියෝකීසියේ මන්ත්‍රණ සභාවේදී කඩුගන්නාව දෙමළ සභාව නියෝජනය කර ඇත.

තවද එම කාලවල් තුළ ගරු ඒ. ආර්. ඩයස් අබේසිංහ, ගරු ටී. ජී. අබේසිංහ, ගරු එෆ්. බී. තිරිමාන්න යන දේවගැති තුමෝ සේවය කළ බව පෙනෙන්නට ඇත.

පසු කාලීනව ගරු සෑම් ඩි සිල්වා පියතුමා කුරුණෑගල දියෝකීසියේ දේව සේවකයෙක් ලෙස සේවය කරන ලදි. මෙම සභාවේ වැඩ ක්‍රියාවේ යෙදුන කාලවල දියෝකීසි මන්ත්‍රණ සභාවේ මෙම සභාව නියෝජනය කළේ ලීන් දසනායක මහතාය.

වසර 150 සමරණ ක්‍රිස්තු දේවස්ථානය කඩුගන්නාව සභාවට බොහෝ සේ දෙවිපියාණෝ ආශිර්වාද කරන සේක්වා. මට ද එම දෙව් මැදුරේ සේවය කිරීමට දෙව් පියාණන් වහන්සේ මඟ පෙන්වීම ගෙන දුන් සේක. ඒ මාගේ 2005 - 2007 දක්වා ගරු ජයනාත් පියතුමා සමඟ සහයක පියතුමා ලෙසත් ඉන් අනතුරුව පළාත් භාර පියතුමා වශයෙන් 2009 වසරේ මැද සිට 2014 දක්වා කාලයද මා හට සේවය කිරීමට දෙව් පියාණන් මඟ පෙන්වීම ලබා දෙන ලදි.

සිංහල හා දමිළ සභිකයන් සමඟ සමාදානයෙන් හා ප්‍රේමයෙන් යුක්තව මෙම කාල වකවානුව තුළ මා සේවය කල වසර 150 සමරණ අද දින පළාත් භාර පියතුමාටත් ගිහි නිළධාරි මණ්ඩලයටත් සියලුම සභිකයන්ටත් දෙව් මැදුර වඩ වඩා වර්ණවත් කර ගන්නට දෙවියන් වහන්සේ මහත් සේ ආශිර්වාද කරන සේක්වා.

ස්තූතියි,
ගරු රෝහණ රාජපක්ෂ පියතුමා
පළාත් භාර පියතුමා, ක්‍රිස්තු දේවස්ථානය, වත්තේගම.